# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## මාර්ගගත කෙටිකාලීන භාෂා පාඨමාලා - 2025

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන පීඨය මඟින් පවත්වනු ලබන මාර්ගගත කෙටි කාලීන භාෂා පාඨමාලා (Online Short Course on Languages) සඳහා 2025 පෙබරවාරි මස 28 දින දක්වා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පාලි, සංස්කෘත, සිංහල, ඉංග්‍රීසි, දෙමළ, චීන, ජපන්, කොරියන් , ප්‍රංශ, හින්දි භාෂා වලට අදාළ පාඨමාලා

**ඇතුළත් වීමේ සුදුසුකම්:**

- මෙම භාෂා පාඨමාලා ඉලක්ක කර ඇත්තේ භාෂාව පිළිබඳ කිසිදු දැනුමක් නොමැති එහෙත් ඒ සඳහා උනන්දුවක් දක්වන අපේක්ෂකයන් උදෙසා වන බැවින් වයස අවුරුදු 16 සම්පූර්ණ වීම හැර වෙනත් කිසිදු පූර්ව සුදුසුකමක් අවශ්‍ය නොවේ.

**පාඨමාලා කාලය:**

පාඨමාලා කාලය මාස 06 ක් වන අතර දේශන මාර්ගගත ව පැවැත්වේ.

**මාධ්‍යය -** සියලු ම භාෂා පාඨමාලා සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යය මගින් පැවැත් වේ.

**අයදුම්පත්‍ර ගාස්තුව :** රු. 500/=
(එය ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 711202 ගිණුමට බැර කොට අදාළ රිසිට් පත අයදුම්පත සමඟ යොමු කළ යුතුය.)

**පාඨමාලා ගාස්තු :**

පාඨමාලා ගාස්තුව රු. 12,500/=
(පාඨමාලා ගාස්තුව ලියාපදිංචියෙන් පසුව ගෙවිය යුතුය.)

**පාඨමාලා ආරම්භය හා ඉගැන්වීම් ක්‍රමවේදය:**

පාඨමාලාව 2025 මාර්තු මස සිට ආරම්භ කරන අතර මාර්ගගත ක්‍රමයට විවිධ තාක්ෂණික මෙවලම් යොදාගනිමින් කණ්ඩායම් ක්‍රියාකාරකම්, ප්‍රස්තුතිකරණ, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ආධාරක ආදිය ඇසුරින් ආකර්ෂණීය ලෙස දේශන පැවැත්වේ.

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරය :**

**වෙබ් අඩවිය මගින්**

අයදුම්පත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට (www.bpu.ac.lk ) පිවිස බාගත කර ගත හැකිය. දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරණ ගිණුමට බැර වන පරිදි අයදුම්පත් ගාස්තුව වන රු. 500/- ක මුදල ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම් පතට අමුණා එවිය යුතුය.

**තැපැල් මගින්**

තැපැල් මගින් අයදුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි **රු. 500/-** ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද "9 x 4" ප්‍රමාණයේ රු. 50/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට 2025.02.28 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"Application form for Online Short Course on Languages"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත් ලබා ගැනීමේ දී ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු.500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.500/-මුදල ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ ගෙවන ලද ලදුපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025.02.28 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025.02.28 වේ. අයදුම්පත් තැපැල් මඟින් එවන්නේ නම් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. **අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**දුරකථන අංක : 011-2580609 / 011-2502944**

නියෝජ්‍ය ලේඛකාධිකාරී (ලේඛකාධිකාරී-වැඩබලන)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
214 බෞද්ධාලෝක මාවත, කොළඹ 07
2025.02.07